# පැහැරගැනීම

ඉරත් එක්කල ඔට්ටු වුණු
හන්දම ඉඩෝරයකුත් නැතුවම
කහවෙච්ච පොළවක හැංගිච්ච
තෙත් බව හිතට අරගෙන

මවාගත් තරහකින් කතරෙ
පාළුව හෙමින් පන්නපු
ඉන්පස්සෙ මා එක්ක හිනැහුණු
මලක් හුන් කිනිත්තක්
ගසකින් උදුරගෙන පොතක් තුළ කවි
බහාලූයෙමි හුස්ම හිරකර
සදාකාලෙට සුරැක ගන්නට

පාළු වී ගිය ක්ෂේමභූමියෙ
දොසක් නොකියනා මුත්
හිතක් හඬවන
දුම්වලාවක් වැනි අසරණ
සිනාවක් දුටුදින
මතක නැති කවි පෙරළ පෙරළා
ඇව සෙව්වෙමි.

පොතේ පිටුවක් බදාගෙන
මගේ කවියක් තුරුළු කරගෙන
ඇ හොරට නිදාගෙන
මලේ පෙති රහස දැනගෙන
පොතේ පිටු සුවඳ අහගෙන
මගේ කවියක් හොරකමුත් කරගෙන
ඔච්චමුත් කරයි දැං මට

මලේ පාටින් කඳුළු සළකුණු
එකින් එක පොතේ පිටු
මතින් තිය තිය ඉගිල්ලිලා
ආ හැටි ආයෙමත්
උගුල්ලපු මගේ අතටම

# නීරෝ

දැසි දසුන් මා දනන්
පිරිවැරූ රෝම නුවරම
ගිනිගන්න විට
වෙණක් වත් නොවයා
කෙසේනම් හිඳිනද

මුළුමහත් රෝම
නුවරම වසා පැතිරෙන
එගිනි කඳ නොදැක
වෙණ වැයූවා නොවේ මා

ම වෙත දොස් නගන
ඇමට පෙර ඔබ
දුටු හෙයින් මම
එ ගිනි කඳ
මුළුමහත් රෝම නුවරම
වසා පැතිරෙනා වග

මා අතින් මිය ඇදෙන
කිතුනු බැති මතුන්
ගැන මෙන්ම ඔබ ගැනද
උපන් වූ මහත් සෝකෙන්
වැයූවෙමි මීරි වෙණ නද

ඉදින් යළි යළිත් නොනගනු
මැනව දොස් මා හට
වැයූවේ මා වෙණ
නොහැකි මුත් ගිනි නිවත
හැකි හෙයිනි සොව නිවත

# ඇපල්

මේ ඇපල් හැර
වෙන ඇපල් නැද්ද
ආයෙමත්
ඇය ඇහුව

මේ රසය
නුහුරුයි නුපුරුදුයි
හරිම අමුතුයි
ඇපල් දැයි මේ
මට සැකයි

ඊළඟට
ඇය කිවුව

## සීතා අයදින්නෙ අපි දැං ඔබේ වදනයි

සීතා අයදින්නෙ අපි දැං
ඔබේ වදනයි
අසා ඇත්තේ අප මෙතෙක් කල්
උන් කියූ කථාවයි

සරණ දුන් පියාණන් ඔබ කුමරෙකුට
ඔවාදුණි දුන්න සේ මුදුවන්න යැයි
ඔහු දෑත මත
ශිවගෙ බලගතු දුනුත් දෙකඩ කළ
ඔහු දෑත මත
මව්පියන් වෙත බැතිසිතින් හිස නමා
කුලගෙයින් නික්මුණු ඔබ උන්ට
ආදර්ශවත් දුවණියක් විය

සමිඳු සමගින් වනගතව හිඳ
සුවදිවිය අහිමිව රළුබවින් හෙම්බත්ව ගත
අනුන් අතපත්ව අතවරද විඳ
පැමිණි විට නුඹ යළිත්
පුද කළේ රුදුරු ගිනිදැල් වෙත ය  ඔහු
පතිවත සොයන්නට
ගොදුරක් ය නුඹ දෙදෙනෙකුට ගොදුරු වුණු

කටුක සෑයක දවාලන්නට මිසක
ඔබ ගත මලින් පුදනට
සිත් නොවී ඔහු හට

විමසුමින් තොර ව
ඔහු මගට ඉඩ හළ
ඔබ උන්ට ආදර්ශවත් බිරිඳ විය

ලියූ කිවිඳුන් නුඹ ගැන
කීය මේ ලෙස
ගැහැනිය නොවටී සවන් යොමනට
පෙලුමටය නිසි ඇය තිරිසනකු විලසින්
එවන් සිතකින් උපන් කවිකම්
තුළින් නොපතමු
ගැහැනියක වරුණක්
නමුත් ලොව අසා ඇත්තේ මෙතෙක් කල්
උන් කියූ කථාවයි

සීතා අයදින්නෙ අපි දැන්
ඔබේ වදනයි
අසා ඇත්තේ අප මෙතෙක් කල්
උන් කියූ කථාවයි

උන් නැමූ දුනු ගැන මිසක නුඹ දැරූ
මහ බරැති ජීවිත දුන්න ගැන නොවෙයි.
මිහිකත පවා ගුණකදින්
නුඹ සලිත කළ බව නොවෙයි.
ඉතින් කිව මැනව අපට නිහඬ කළ'යුරු
උන් ඔබ ව

සීතා අයදින්නෙ අපි දැන්
ඔබේ වදනයි
අසා ඇත්තේ අප මෙතෙක් කල්
උන් කියූ කථාවයි

(බිනා අගර්වාල්ගේ Sita speak නම් පැදියේ සිංහල අනුවර්තනයකි)

## බොන්සායි කළ ජීවිත

කඩවසම් බඳුන තුළ හිඳින
බොන්සායි රුක....
අටරියන් උසට වැඩෙන්නට සිටි තුරකි
කඳුබෑවුමක් මත
අකුණකින් දෙබෑ වන තුරු

නමුත්, උයන්කරුවකු
කෙටිකළෙන් එය සීරුවට
අඟල් නමයකි
දැන් ඇගේ උස
අතු අහින හැමදිනම ඔහු
සිහින් හඬකින් ගයන ගීයකි

කොයිතරම් අපූරුද ඔබේ මහිමය
බඳුනක වැඩෙන්නට වරම් ලද
කුඩා පැළයක් විලස
සදා සුරැකිව
ගෘහගතව, සියුමැලිව
විසුමයි ඔබේ උරුමය

තවත් එක් ජීවී පිරිසකගෙ
සිත් පහන් කරනට
ළමාවියෙ පටන් කෙනෙකුගේ
ජීවිතය කුරු බවට පත්කෙරෙනු ඇත.
වෙළා බැඳ පතුල් කෙටිකර
නුවණැස තලා මට්ටම් කර
වරලස කටු ගසා සැරසූ කළ
පැසසුමින් යුතු දැත්
ඔබ වෙතට දිගුවෙනු ඇත.

- මාර්ජ් පියර්සිගේ A work of Artifice නම් පැදියේ අනුවාදයකි.